# තෙවන වාර පරීක්ෂණය - 2024

# 8 ශ්‍රේණිය

# කතෝලික ධර්මය i , ii - පිළිතුරු පත්‍රය

## I කොටස

01. iii. සෙකරියස් තුමාගේ යාග පූජාව.
02. ii. පාවුලු තුමාගේ
03. i. මනුෂ්‍ය ජාතියේ ආරම්භකයා වූ ආදම්ගෙනි.
04. iv. යහපත් සමරිතානුවරයාගේ උපමාවෙනි.
05. iv. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතයි.
06. i. නාතාන් දිවැසිවරයා.
07. ii. දෙවතාවකි.
08. iii. විශ්වය මැවීමත් - විශ්වයේ පරිපාලන කිරීමේ කාර්යන්ය.
09. i. පළමු පණතටය.
10. iii. පදක්කම් පැළඳීම
11. දයාවේ ශුභාරංචිය
12. ප්‍රසිද්ධ ජීවිතය
13. අභිවෘද්ධිආලේපය
14. ක්‍රිස්මා තෛලයෙන්
15. දිව්‍ය පූජාව
16. දේව දූතයා විසින් සෙකරියස් තුමාට
17. ජොහාන් තුමා විසින් හමුදා නිලධාරීන්ට
18. ජේසුස් වහන්සේ විසින් යක්ෂයාට
19. ජේසුස් වහන්සේ විසින් කුදු ස්ත්‍රියට
20. දේව දූතයා විසින් මරිය තුමියට

( ලකුණු 2 X 20 = 40 )

## II කොටස

01. (i) ආදම් සහ ඒව

(i) ⋆ ජේසුස් වහන්සේ සැබෑ දේව පුත්‍රයාණන් බව ⋆ ස්වභාව ධර්මය පවා උන්වහන්සේට කීකරු වන බව

(iii) ආත්මානුභාවය / දේවාත්මානුභාවය / ශුද්ධාත්මය

(iv) 1. රාජගුරුප්‍රසාදීන් වහන්සේ . සාමාන්‍යයෙන් අභිවෘද්ධි ආලේපය දානය කරනු ලබන්නේ රදගුරුතුමන් විසිනි.

2. වැඩිහිටියන්ට ප්‍රසාද ස්නාපනය දනය කරන විට මීසම් සේවක පියතුමා විසින්

3. රාජගුරුප්‍රසාදීන් වහන්සේගේ විශේෂ අවසර ලත් පූජාප්‍රසාදිතුමෙකු විසින්

4. මරණාසන්න පුද්ගලයෙකුට . ඕනෑම පියතුමෙකු විසින්

(v) ධර්මදානය හා ධර්මදූත සේවය

(vi) ⋆ කෙරුබ්වරු (දේව දූතයන්) (නික්ම යාම 25:18.22) - ගිවිසුම් කරඬුව අලංකාර කරන පිණිස සාදන ලද රූපය

⋆ ලෝකඩ සර්පයා (ගණන් කථාව 21:8.9) - සර්පයන් දෂ්ට කළ අයට සුවය ලබන පිණිස සාදන ලදි.

(vii) ආශීර්වාද කිරීමට, / ප්‍රශංසා කිරීමට, / යාච්ඤා කිරීමට / මහිමයට පත් කිරීමට

(viii) ලාඕස් - ජනතාව / එර්ගොන් - සේවයකි - වැඩකි

(ix) දේව වාක්‍ය පිළිවෙත හා ස්තෝත්‍ර යාගික පිළිවෙත

(x) 1. පළමු වන දේව ප්‍රකාශය    2. පිළිතුරු ගීය    3.දෙවන දේව ප්‍රකාශය
4. සුපුවත් ජය නද (සාධුකාරය)    5. සුබාරංචි ප්‍රකාශය    6. ධර්මානුශාසනාව
7. විශ්වාස ලක්ෂණය    8. විශ්වාසකයින්ගේ යැදුම්

**( ලකුණු 2 X 10 = 20 )**

02. (i) ගවයා **(ලකුණු 02)**

(ii) ලූක් පමණක් මා සමග සිටී මාත් ඔබ සමග කැඳවාගෙන එන්න. මාගේ වැඩට ඔහු ප්‍රයෝජනවත් සහකාරයෙකි"
(2 තිමෝති 4:11)
- "මාගේ හවුල් සේවකයන් වන මාක් ද .... ලූක් ද ඔබට ආචාර කරති. (පිලමොන් 1:24)
- "අපේ හිතවත් ලූක් නම් වෛද්‍යවරයා ද.... ඔබට ආචාර කරති. (කොලොස්සි 4:14)

**(ලකුණු 03)**

(iii)
- දේවස්ථානයේ ගායනා කණ්ඩායමට සහභාගී වීම.
- පාසලේ මිතුරු මිතුරියන් හට අධ්‍යාපන කටයුතු සඳහා සහය වීම.
- තමන් සතු දේ අන් අය සමග බෙදා හදා ගැනීම
- දෙවියන් වහන්සේගේ මහිමය ගැන කියවෙන ගීතිකා, ලිපි ආදිය නිර්මාණය කිරීම
- දේව වචනය අන් අය සමග බෙදා ගැනීම ..... ආදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

**(ලකුණු 05)**

03. (i)
- දෙවියන් වහන්සේගේ පාලනයට නතුවීම යි
- පාපය ඉවත ලා දේව වරප්‍රසාදය තුළ ජීවත් වීම යි
- දේව අභිමතයට මිනිස් සමාජය නතු වීම යි
- ප්‍රේමය, සත්‍යය, යුක්තිය, සාධාරණත්වය හා
- ගුණ ධර්ම අනුව ජීවත් වීම යි

**(ලකුණු 02)**

(ii)
- යහපත් සමාරියා පිළිබඳ උපමාව (ලූක් 10:25.37)
- නැතිවුණු පුත්‍රයා පිළිබඳ උපමාව (ලූක් 15:11.22)
- ධනපතියා සහ ලාසරස් පිළිබඳ උපමාව (ලූක් 16:19.31)

**(ලකුණු 03)**

(iii)

| බීජ වැටුණු බිම | බීජ වලට සිදු වූ දේ | උපමාවේ විවරණය |
|---|---|---|
| මග දිගේ වැටුණු බීජ | කුරුල්ලෝ ඒවා අහුලා ගෙන කෑහ. | බීජ නමැති දේව වචනය සිත නමැති කෙතෙහි වැපුරූ නමුදු යක්ෂයා ඇවිත් පැහැර ගනියි. |
| පස් නැති ගල් බිමේ වැටුණු බීජ | වහා පැළ වූ නමුත් හිරු නැගුණු විට මුල් නැති බැවින් වියළී ගියේ ය. | දේව වචනය සතුටින් පිළිගෙන ටික කලක් ඒ අනුව කටයුතු කර පරීක්ෂා කාලයෙහි දේව වචනය අමතක කර කටයුතු කරයි. |
| කටු අතර වැටුණු බීජ | කටු ගස් වැවී ඒවා යට කර දැමී ය. | දේව වචනය අසා ජීවිතයේ දුක් කම්කටොලුවලින් ද වස්තුවෙන්ද ඉඳුරන් පිනවීමෙන් ද වචනය යටපත් වීම නිසා කෙනෙක් එල නොදරති. |
| සරු බිමෙහි වැටුණු බීජ | එකකින් සිය ගුණයක් එල දැරී ය. | අවංක, පිරිසිදු සිතකින් වචනය අසා, පිළිපැද, නොපසුබට වීර්යයෙන් පල දරන අය වෙති. |

**(ලකුණු 05)**

04. (i) 1. දේව ප්‍රසාද නිධානයකි    2. භෝජනයකි    3. යාගයකි    4. ගිවිසුමකි
5. ස්තුති කිරීමකි    6. සිහි කිරීමකි.

**(ලකුණු 02)**

(ii) 1. මෙල්කිසෙදෙක්ගේ යාගය    2. මන්නා භෝජනය
3. ඉශ්රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය    4. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය

**(ලකුණු 03)**

(iii) **ආත්මික සූදානම.**

* ආත්මික සූදානම යනුවෙන් අදහස් කරන්නේ පාපයෙන් තොර වීම ය.

* මරණීය පාපයක් කර ඇත්නම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර පාපෝච්චාරණය කර ගත යුතු ය.

* සුළු පාපයක් කර ඇති අය දිව්‍ය පූජාව ආරම්භයේ තම පාපවලට මනස්ථාප වී සමාව ලබා ගෙන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම කළ යුතු ය.

* මරණීය පාපයක් කර ඇති කෙනෙක් දිව්‍ය පූජාවට පෙර සමගි සන්ධානයේ දේවප්‍රසාද නිධානය ලබා ගැනීමට අවස්ථාවක් නොමැති නම් තම පාපවලට දුක් මනස්ථාප වී අවස්ථාව ලද විගස සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට සිතා ගෙන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත හැකි ය.

**ශාරීරික සූදානම.**

* ශාරීරික සූදානම යනුවෙන් අදහස් කරන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර අවම වශයෙන් පැයක්වත් සියලු ආහාරපානවලින් වැළකී නිරාහාරශීලී ව සිටීම ය. තමන් කැමති නම් ඊට වඩා වැඩි කාලයක් වුව ද නිරාහාරශීලී ව සිටිය හැකි ය.
* පැයක කාලය ඇතුළත ජලය හා බෙහෙත් භාවිත කිරීමට තහනමක් නැත.

* පැයක නිරාහාරශීලීය රෝගී අයට මහලු අයට හා මහලු අයට උපස්ථාන කරන අයට අවශ්‍ය නොවේ.

**(ලකුණු 05)**

05. (i) රූප වන්දනාව යනු පුද්ගලයෙක් හෝ රූපයක් හෝ ලෞකික වස්තුවක් හෝ දේවත්වයෙන් සලකා, ඔහුට හෝ ඇයට හෝ එයට හෝ වන්දනා කිරීම යි. **(ලකුණු 02)**

(ii) ඔවුන්ට යාච්ඤා කරමින්, / ඔවුන්ගේ ශුද්ධ වූ ධාතුවලට හා ප්‍රතිමාවලට ගරු බුහුමන් දැක්වීමෙන්. / ඔවුන්ගේ ආදර්ශ අනුගමනය කරමින් අපගේ ජීවිත ගොඩනගා ගැනීමෙන් **(ලකුණු 03)**

(iii)
- ජීවිතයේ සෑම කටයුත්තක දී ම දෙවියන් වහන්සේට මුල්තැන ලබා දීම
- දේව වචනයට මුල් තැන දෙමින් දිනපතා ශුද්ධ බයිබලය කියවා මෙනෙහි කිරීම
- සාන්තුවරුන් අන් අයට උදව් වීමට මැදහත් වන ආකාරයට අප ද අන් අයට උදව් වීමට නොපසුබට විය යුතුය
- සාන්තුවර චරිත කතා කියවමින් ඒවා තම ජීවිතයට ආදර්ශයක් කර ගැනීම
- සාන්තුවරුන් දේව නියමයන් අනුව ජීවත් වූ ආකාරය පිළිබඳ කරුණු සොයා ගෙන ඒ අනුව ජීවත් වීම
- දේවස්ථානයේ සාන්තුවර මංගල්‍ය අවස්ථාවල පැවැත්වෙන නුවාන හා දිව්‍ය පූජාවට සම්පූර්ණයෙන්ම සහභාගි වීම. **(ලකුණු 05)**

06. (i) දිව්‍ය පූජාවේ ආරම්භක ගීතිකාවේ සිට අවසාන ගීතිකාව දක්වා ම සහභාගී වීම යි. **(ලකුණු 02)**

(ii) මග්දලාවේ මරියාට දර්ශනය වීම (ජොහන් 20:11.18)
. ශ්‍රාවකයන්ට දර්ශනය වීම (ජොහන් 20:19.23)
. තෝමස් තුමාට දර්ශනය වීම (ජොහන් 20:24.29) **(ලකුණු 03)**

(iii)
- සෑම විට ම දෙවියන් වහන්සේට ස්තුති ප්‍රශංසා කරමි.
- පාසලේ හා මීසමේ සමිති සමාගම්වලට බැඳී අසරණ වූවන්ට සරණ වෙමි.
- අන් අයගේ දුක් වේදනා හමුවේ සංවේදී වී පිහිට වෙමි.
- මගේ ලෞකික සැපතේ දී පමණක් නොව අන් අයගේ සැපතේ දී ද සතුටු වෙමි.
- පාසලේ අසරණ වූ හා කොන් වූ සැමට කරුණාව දක්වමි.
- මා සතු දේ අන් අය හා බෙදා ගනිමි.
- ජනවන්දනා කටයුතු සංවිධානයේ දී සහාය වෙමි. **(ලකුණු 05)**

07. (i) **ස්නාවක ජොහාන් තුමා**

සෙකරියස් තුමා සහ එලිසබෙත් තුමිය ශුද්ධ වූ ස්නාවක ජොහන් තුමාගේ දෙමාපියෝ වූහ. මව වූ එලිසබෙත් තුමිය දේව මාතාවන්ගේ ඥාතිවරියකි. සෙකරියස් ජුදා පූජක පෙළපතට අයත් වූවෙකි. ස්නාවක ජොහන් තුමා උපත ලබා අටවන දිනයේ දී චර්මච්ඡේදන පිළිවෙත සිදු කිරීමට හා නම් තැබීමට සූදානම් වූ අවස්ථාවේ සෙකරියස් තුමා ස්වාමීන් වහන්සේගේ දූතයා කීනම ප්‍රකාශ කළ පසු එතුමාගේ ගොළු බව දුරු විය. ස්නාවක ජොහන් තුමා ජනතා මෙහෙවර ආරම්භ කළේ ජෝර්දාන් ගඟේ ඒනොන් තොටුපළ ආශ්‍රිත ප්‍රදේශයේ ය. පළගැටියන් හා වන මී එතුමාගේ ආහාරය විය. ඔටු ලොම් වස්ත්‍රයක් ඇඳ, ඉණ වටා හම් පටියක් බැඳ සිටි මෙතුමාට පැවරුණු දේව කාර්යය වන්නේ මෙසියස් වහන්සේගේ, එනම් වඩින්නට සිටින තැනැන් වහන්සේ වූ ජේසුස් වහන්සේගේ පෙරමග සූදානම් කිරීම ය.

(ii) **ශුද්ධාත්ම ආගමනය**

ශුද්ධාත්ම ආගමනය පෙන්තකොස්ත දින සිදු වූ බව - එහිදී දක්නට ලැබුණ සිදුවීම
- සැඩ සුළගක් හමනාක් වැනි හඬක් හදිසියෙන් අහසින් නික්මුණු බව
- ගිනි දළු වැනි දිව් බෙදී ගොස් එකිනෙකා මත පිහිටීම
- සියල්ලෝ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම
- අන්‍ය භාෂාවලින් කථා කිරීම
- මේ අවස්ථාවේ දී මරිය තුමිය ඇතුළු 120 ක් පමණ දෙනා සේනා කුළු ශාලාවේ සිටි බව
- ශුද්ධාත්ම ආගමනයෙන් පසුව නොබියව ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීම

(iii) **යාම යැදුම**

ශුද්ධ වූ සභාවේ නිල යැදුම ලෙස යාම යැදුම හඳුන්වනු ලබයි. දවසේ නිශ්චිත කාලවල දී (යාමවල දී) ගීතාවලියේ ගීතිකා හා ශුද්ධ බයිබලීය ගීතිකා ඇසුරින් දේව ජනතාව එක් වී දෙවියන් වහන්සේට සිදු කරන ප්‍රශංසාත්මක යාච්ඤා පිළිවෙතක් ලෙස යාම යැදුම ඉතා සරල ව හඳුන්වා දිය හැකිය. දවසේ නිශ්චිත යාමවල දී මෙය සිදු කෙරෙන හෙයින් "යාම යැදුම" ලෙස එය හඳුන්වනු ලබයි. (උදේ, දිවා, සවස හා රාත්‍රි යන කාලයන්හි) ශුද්ධ වූ සභාවේ මෙම නිල යැදුම තුළ පූජක, පැවිදි හා ගිහි පිරිස ප්‍රසාද ස්නාපනයෙන් තමන් ලද පූජක වගකීම් ක්‍රියාවට නංවයි. සියලු කාලය දෙවියන් වහන්සේට අයිති ය. එම නිසා සෑම යාමයක දී ම දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම යාම යැදුමේ පරමාර්ථය යි. පූජක හා පැවිදි පිරිස දිනපතා යාම යැදුම සිදු කරයි. ගිහි සැදැහැවතුන් දේවස්ථානයේවාර්ෂික මංගල්‍යයට පෙරදින පැවැත්වෙන සන්ධ්‍යා යාම යැදුම අවස්ථාවේ දී මීට එක් වේ.

(vi) **දේව ප්‍රසාද නිධාන**

උත්ථානව වැඩ සිටින දෙවි සමිඳුන් සම්මුඛ වීම සඳහා ඇතුළතින් අප වෙත දානය කරනු ලබන දේව වරප්‍රසාද බාහිර වශයෙන් සලකුණු වන ආකාරයෙන් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති සංඥා පිළිවෙත් දේව ප්‍රසාද නිධාන වේ.
- දේව ප්‍රසාද නිධාන 7 ක් බව. එම ප්‍රසාද නිධාන හත විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
- බාහිරව මෙන්ම ආධ්‍යාත්මිකව නිසි සූදානමකින් ලබා ගත යුතු බව
- දේව ප්‍රසාද නිධාන වරප්‍රසාද රැසක් ලැබෙන බව වැනි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

**( ලකුණු 5 X 2 = 10 )**

.